# මහේල ගේ හුදකලා ඉනිම




සාමූහිකව කණ්ඩායමක් ලෙස ක්‍රීඩා කරන්නේ නම් ජයග්‍රහණ ලබා ගැනීම පහසු කාර්යයක් වන්නේ ය. එය ක්‍රීඩාවට පමණක් සීමා වූ සත්‍යයක් නොවේ. ඕනෑම අභියෝගයක් ජය ගැනීමට සාමූහිකව කණ්ඩායම් හැඟීමෙන් ක්‍රියා කළ යුතු ය. එහෙත් අපේ ක්‍රිකට් වල එවැනි සාමූහික දස්කම් පෑම් දක්නට ලැබෙන්නේ කලාතුරකින් වීම කණගාටුවට කරුණකි.

සමහර අවස්ථා වල ඩිල්ෂාන් තනිවම යමක් කරයි. එසේත් නැත්නම් කුමාර් සංගක්කාර හුදකලා පිති හරඹයක යෙදෙයි. මහේල තනිවම මැද පෙළ එකතු කරගෙන ජයග්‍රහණය කරා යන්නට උත්සාහ කරයි. අන්තිමේ සාමූහිකත්වයක් නැති බැවින් ජයග්‍රහණය පෙනි පෙනී පරාජය තුරුළු කරගන්නා අයුරු අපට බොහෝ විට දක්නට ලැබෙයි. ශ්‍රී ලංකා කණ්ඩායම ශූරයන්ගේ කුලාන තරගාවලියේ සහභාගි වූ අවසන් තරගයේ සිදුවූයේ ද එයයි.

කරුණු කෙසේ වුවත් මහේලගේ හුදකලා ක්‍රිකට් සටනට වඩා ඔහුගෙ බලාපොරොත්තු සුන් කර ගනිමින් තනිවම සටන් වදින තවත් උදාර කටයුත්තක් ගැන යමක් ලිවීමට කාලය එළැඹ ඇතැයි මම සිතමි.

මහේලගේ සොයුරු ඩිෂාල් 1995 දී මෙලොවින් සමු ගත්තේ පිළිකා රෝගයට ගොදුරු වීමෙනි. එකම

**මුලු මහත් ශ්‍රී ලංකාවටම ඇති එකම පිළිකා රෝහල මහරගම පිහිටා ඇති අතර එම් ඇති ඇඳන් 650 කට සීමා වූ නේවාසික පහසුකම් වලින් මෙම මාරාන්තික රෝගයට ගොදුරු වූ රෝගීන්ගෙන් 5% කටවත් පහසුකම් සැපයීම අපහසු ය. අනෙක් අතට එය නවීන පහසුකම් සහිත ආරෝග්‍යශාලාවක්ද නොවේ. මහේල විසින් සැළසුම් කරන ලද පිළිකා රෝහල සත් මහල් ගොඩනැගිල්ලක නේවාසික රෝගීන් සඳහා ඇඳන් 750 ක් ඇති සහ බාහිර රෝගීන්ට ද සියලු පහසුකම් ද සපයන රෝහලක් වීම ඉතා වැදගත් ය.**

සොහොයුරාගේ වියෝවෙන් කම්පාවට පත් මහේල එම කම්පනය නිසාම එක්තරා කාල පරිච්ඡෙදයක අසාර්ථක ක්‍රීඩා විලාශයක් පෙන්නුම් කළ සැටි ඔබට මතක ඇතැයි සිතමි. මේ සියලු අභියෝගයන්ට මුහුණ දීමට ඉතා අධිෂ්ඨානපූර්වකව ක්‍රියා කරමින් ක්‍රිකට් ක්‍රීඩාවට පමණක් නොව සමස්ථ ශ්‍රී ලංකාවටම සෙතක් සැළසෙන අයුරින් ඉතා උදාර කටයුත්තක් ආර්ම්භ කළේය. එනම් ශ්‍රී ලංකාවේ පිළිකා රෝගයට ගොදුරු වී සිටින්නන් සඳහා ලෝකයේ දැනට භාවිතා වන සියළුම වෛද්‍ය විද්‍යාත්මක උපකරණ පහසුකම් සහිත අංගසම්පූර්ණ රෝහලක් ගොඩනැගීමේ ව්‍යාපෘතියක් ආරම්භ කිරීමයි.

2002 දී ආරම්භ කළ මේ රෝහල ඉදිකිරීමේ ව්‍යාපෘතිය මිලියන 20 ක පමණ ජනගහනයක් වෙසෙන අපේ මව්බිමට ඉතා අවශ්‍යම ව්‍යාපෘතියක් බව කිව යුතු නොවේ. මුලු මහත් ශ්‍රී ලංකාවටම ඇති එකම පිළිකා රෝහල මහරගම පිහිටා ඇති අතර එම් ඇති ඇඳන් 650 කට සීමා වූ නේවාසික පහසුකම් වලින් මෙම මාරාන්තික රෝගයට ගොදුරු වූ රෝගීන්ගෙන් 5% කටවත් පහසුකම් සැපයීම අපහසු ය. අනෙක් අතට එය නවීන පහසුකම් සහිත ආරෝග්‍යශාලාවක්ද නොවේ. මහේල විසින් සැළසුම් කරන ලද පිළිකා රෝහල සත් මහල් ගොඩනැගිල්ලක නේවාසික රෝගීන් සඳහා ඇඳන් 750 ක් ඇති සහ බාහිර රෝගීන්ට ද සියලු පහසුකම් ද සපයන රෝහලක් වීම ඉතා වැදගත් ය. එදා මේ සඳහා ඇස්තමේන්තු කර තිබූ මුදල ඇමරිකන් ඩොලර් මිලියන 750 කි. HOPE නමින් නම් කර තිබූ මෙම රෝහලේ ඉදිකිරීම් නිම කිරීමේ සිහිනය සැබෑකර ගැනීමට එදා මහේල සමඟ දානපති ව්‍යාපාරිකයන් එක්ව සිටි අතර වෛද්‍ය උපකරණ සැපයීම සඳහා ජපානය ද ගිවිසුම් අත්සන් කර තිබුණි. සිංහ සමාජය වැනි සුබසාධන සංවිධාන මහේලට අත දීමට ඉදිරිපත් වූ අතර මහේලට තිබූ ලොකුම අත්වැල ශ්‍රී ලංකා ක්‍රිකට් ක්‍රීඩකයන්ගේ සංගමය මෙම කාර්යයේ කොටස් කරුවකු ලෙස ඔහු සමඟ අත්වැල් බැඳ ගැනීමයි.

මෙම ව්‍යාපෘතියේ සැබෑ වටිනාකම වටහා ගත් සෞඛ්‍ය අමාත්‍යාංශය ද මහරගම පිළිකා රෝහලට යාබදව පිහිටි පර්චස් 270 ක ඉඩමක්ද මේ සඳහා ලබා දීම සිහිනය සැබෑ කර ගැනීමේ මහා සටනට ලැබුණ මනා අත්වැලක් විය.

මෙසේ සියල් සූදානම් වෙමින් තිබෙන අතර ශ්‍රී ලංකාවට ආ සුනාමිය මහේලගේ ව්‍යාපෘතියද යටකරගෙන ගියා යයි කීවොත් නිවැරදි ය. සුනාමියෙන් අවතැන් වූවන්ට උපකාර කිරීම සඳහා මහේල වටා සිටි සියල්ලන් විසිර ගියෙන් HOPE ව්‍යාපෘතිය තනිකරම මහේලගේ හිස මතට නිරායාසයෙන්ම පැමිණියේ ය. සියලු දෙනා ඔහු හැර ගියත් ශ්‍රී ලංකා ක්‍රිකට් ක්‍රීඩකයන් හෝ ඔහු වටා එක් වූයේ නම් මහේලගේ පමණක් නොව මුලු මහත් ශ්‍රී ලාංකියන්ගේම සිහිනයක් වන මේ රෝහල නිමවා මේ වන විට බොහෝ දුර ඉදිරියට යන්නට හැකියාවක් ලැබෙන්නට ඉඩ තිබුණි. එහෙත් එක් අයෙක් හෝ දෙදෙනෙක් හැරෙන්නට ක්‍රිකට් ක්‍රීඩකයන්ගෙන් ලැබුණ පිලිසරණක් ද නැත. වසරකට මිලියන 20- 30 ක් පමණ උපයන ක්‍රිකට් ක්‍රීඩකයන්ගේ කර ඇරීම කණගාටුදායකය. දැන් මහේගට තනිව ක්‍රීඩා කර ඉණිම ගොඩ නැගීමේ වගකීම දැරීමට සිදුව ඇත. නෑදෑ හිතවතුන්ගේන ලැබෙන මුදල්ද ඕස්ට්‍රේලියාව එංගලන්තය ඩුබායි වැනි රටවල සංචාරයට ගිය පිටි ආධාරකරුවන්ගෙන් ලැබෙන පරිත්‍යාගද හැරුණ කොට HOPE තබාගත හැකි තවත් කිසිවක් ඔහුට හෝ අපට හෝ පෙනෙන්නට නැත. සුවහසක් ශ්‍රී ලාංකික ජනතාවටම සෙත සැළසෙන මෙම කටයුත්ත නිමා කර ගැනීමට දානපතියන් හා ශ්‍රී ලංකා ක්‍රිකට් ක්‍රීඩකයන් මහේල වටා නැවතකත් එක්වී කටයුතු කිරීමට කාලය එළඹ ඇත. තරගයකදී ඉතා මහන්සියෙන් ගොඩ නගන ඉණිමක් කාලත් සමග ක්‍රීඩා ලෝලීන්ට අමතක වන්නට පුළුවන. එහෙත් අවශ්‍ය මූලික පහසුකම් වත් නැතිව දිනපතා මිය යන දහස් ගණන් පිළිකා රෝගීන් ට පිලිසරණක් වන මෙවන් උතුම් කාර්යයක් කිසිදිනෙක ජනතා සිතින් බැහර නොයන බවත් ඔවුන් සදාකාලිකව ස්තුති පූර්වකව එය සිහිපත් කරනු ඇති බවත් සඳහන් කර තබමි.

අසෝක සිල්වා